# ටෙන්ඩර් දැන්වීමයි.

## මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

## මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සතු සුඛෝපභෝගී වාහන විකිණීම සඳහා මිල ගණන් කැඳවීම

1. මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට අයත් පහත සඳහන් වාහන විකිණීම සඳහා අමාත්‍යාංශ ලේකම් වෙනුවට සභාපති, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

| අනු අංකය | වාහන අංකය | වාහන වර්ගය | මාදිලිය | නිෂ්පාදිත වර්ෂය | ආපසු ගෙවනු නොලබන ටෙන්ඩර් ගාස්තුව (රු.) | ආපසු ගෙවන තැන්පතුව (රු.) |
|---|---|---|---|---|---|---|
| 01 | CAA 0024 | Toyota | Land Cruiser V8 | 2013 | 2,000.00 | 50,000.00 |
| 02 | KQ 4566 | Toyota | Land Cruiser V8 | 2011 | 2,000.00 | 50,000.00 |
| 03 | KS 9856 | Mitsubishi | Montero | 2012 | 2,000.00 | 50,000.00 |
| 04 | KN 9521 | BMW | 523 I | 2011 | 2,000.00 | 50,000.00 |
| 05 | KT 7401 | BMW | 740 LI | 2012 | 2,000.00 | 50,000.00 |
| 06 | KY 2703 | Nissan | Patrol | 2014 | 2,000.00 | 50,000.00 |
| 07 | KM 2030 | Toyota | Camry | 2010 | 2,000.00 | 50,000.00 |
| 08 | KX 7946 | Nissan | Teana | 2013 | 2,000.00 | 50,000.00 |
| 09 | JN 4517 | Mitsubishi | Montero Jeep | 2004 | 2,000.00 | 50,000.00 |
| 10 | CAB 3045 | Nissan | X - Trail | 2014 | 2,000.00 | 50,000.00 |
| 11 | KA 2030 | Honda | Accord | 2005 | 2,000.00 | 50,000.00 |

2. එක් එක් වාහනය සඳහා ආපසු නොගෙවනු ලබන රුපියල් දෙදහස (රු.2,000/-) ක සහ ආපසු ගෙවනු ලබන රුපියල් පනස් දහසක(රු.50,000/-) ක ටෙන්ඩර් පත්‍රිකා ගාස්තු **2026.08.20 දින සිට 2026.09.10 දින දක්වා කාර්යාලයීය දිනයන්හිදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00** අතර කාලය තුල **මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ, නව ගොඩනැගිල්ලේ ඉහළ බිම්මහලේ, ගිණුම් අංශයේ සරප් කවුන්ටරය වෙත මුදලින් පමණක්** ගෙවා ටෙන්ඩර් පත්‍රිකා මිලදී ගත හැකිය.
එක් එක් වාහනය සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කල යුතු අතර මුදල් ගෙවන ලද රිසිට්පත් වල පිටපත් ටෙන්ඩර් පත්‍රිකාව සමග ඉදිරිපත් කළ යුතුය. මෙම වාහන වල අයිතිය පැවරීමේදී ගෙවිය යුතු බදු හා වෙනයම් ගාස්තුවක් වේ නම් පැවරුම්ලාභියා විසින් එම මුදල එකවර ගෙවීම් කළ යුතුය.

| | |
|---|---|
| **ටෙන්ඩර් පත්‍රිකා ලබාගත හැකි කාර්යාලය හා ලිපිනය** | ගණකාධිකාරී (සැපයුම්), ගිණුම් අංශය, නව ගොඩනැගිල්ලේ ඉහල බිම්මහල, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය , මහලේකම් කාර්යාලය, කොළඹ 01<br>දු.ක : 0112484500- 1430 (දිගුව) |

3. සතියේ වැඩකරන දිනයන්හි **2026.08.20** දින සිට **2026.09.10** දින දක්වා **පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා මහලේකම් කාර්යාලය, කොළඹ 01 පිහිටි මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී** වාහන පරික්ෂා කර බැලිය හැකිය. වාහන පරික්ෂාව සම්බන්ධිකරණය අමාත්‍යාංශයේ ප්‍රවාහන අංශය මගින් සිදු කෙරේ. (දුරකථන අංකය 011-2484988)

4. මිල ගණන් බහාලු කවරයේ වම් පස ඉහළ කෙලවරේ **"වාහන විකිණීම සඳහා මිල ගණන් - වාහන අංකය XXX"** යනුවෙන් සඳහන් කළ යුතුය.

5. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රිකා **2026.09.11 දින ප.ව.2.00** හෝ ඊට පෙර ලැබෙන පරිදි **සභාපති, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව, ගිණුම් අංශය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, මහලේකම් කාර්යාලය, කොළඹ 01** ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් එවීම හෝ එම ලිපිනයේ පිහිටි ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ සිදු කළ හැකිය. ටෙන්ඩර් භාර ගැනීම **2026.09.11 දින ප.ව.2.00** ට අවසන් වන අතර ඒ වහාම මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ගිණුම් අංශයේදී ලංසු විවෘත කිරීමේ කමිටුව ඉදිරියේදී ඒවා විවෘත කරනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ලබන අතර තැපෑලේදී සිදුවන අස්ථානගතවීම් හා ප්‍රමාදයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය වග කියනු නොලැබේ.

6. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවට ලංසුකරුට හෝ බලයලත් නියෝජිතයෙකුට පමණක් සහභාගී විය හැකිය.

7. ලංසු ලේඛණ නිසි පරිදි සම්පූර්ණ කර අත්සන් තබා නොමැති, මුදල් ගෙවූ රිසිට්පත්වල පිටපත් අමුණා නොමැති හෝ ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර ඇති ලංසුකරුවන්ගේ ලංසු පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. ලැයිස්තුගත වාහන විකිණීමෙන් ඉවත් කිරීමේ හෝ අදාල වාහන සඳහා ඉදිරිපත් කර ඇති ලංසු ප්‍රතික්ෂේප කිරීමේ පූර්ණ අයිතිය අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු තීරණය අවසාන තීරණය වේ.

සභාපති
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන
අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය
කොළඹ 01

දිනය - 2026.08.20